


# රාජ්‍ය සම්මානලාභී නිර්මාණකරුවා රුක්මල් නිරෝෂ් සුළඟ මත මොහොතක් ගෙනෙයි



ශ්‍රීනාත් මද්දුමගේ

2013 හොඳම රූප රචනා සඳහා සම්මානයෙන් පුද ලැබූ රුක්මල් ගෙන් සුළඟ මත මොහොතක් ටෙලි චිත්‍රපටය ජූලි 20 ද මෙල්බර්න් රසිකයනට

රුක්මල් නිරෝෂ් යන නම ටෙලිනාට්‍ය හා චිත්‍රපට නරඹන අප සැමට ඉතා හුරු පුරුදු නමක්. ඉතා අඩු වයසකින් ක්ෂේත්‍රයේ වැඩිම සම්මාන ගොන්නකට හිමිකම් පෑ ඔහු සැබෑ දක්ෂ රංගන ශිල්පියෙන් මෙන්ම සංස්කරණ ශිල්පියෙක්. ඔහු රඟ පෑ බොහෝ චරිත අප හදවතේ ගැඹුරුම



තැන්වල සටහන් වී ඇත. දුන්හිඳ අද්දර, දිය යට කැට පහන, පිටගම් කාරයෝ, නිරානන්දය, සඳ අමාවකයි, චන්දි කින්නරී යන ටෙලි නාට්‍ය හා චිත්‍රපට වල අමතක නොවන චරිත පණ ගැන්වූ රුක්මල් 2000 වසරේ චන්දි කින්නරී චිත්‍රපටයේ රංගනය සඳහා ජනාධිපති සම්මානයෙන්ද පුදනු ලැබීය.

1987 රන් පංචායුධ නම් වූ පාසැල් නාට්‍යයෙන් කරළියට පැමිණි රුක්මල් මොරටුව වේල්ස් කුමර විදුහල් නාට්‍ය ආචාර්යවරයා වූ තිස්ස ගුණවර්ධනයන්ගෙන් රංගනය පිළිබඳව අත්පොත් තැබීය. මෑතකදී ජාත්‍යන්තර සම්මානයෙන් පුද ලත් ජගත් චමිල සහ රුක්මල් එකම නාට්‍යයෙන් කරළියට පැමිණීම ද විශේෂයකි. වේල්ස් කුමර විදුහලේ ආදි සිසුවකු ලෙස තිස්ස ගුණවර්ධනයන් ගෙන් රංගනය හැදෑරීමට වාසනා මහිමය ලද මා අද අප ගේ පාසැල් මාතාව රටට දයාද කල මෙවන් රංගන ශිල්පීන් ගේ ප්‍රතිභාව දැකීමෙන් මහත් සතුටක් ලබමි.

1996 දී සංස්කරණ ශිල්පියෙකු ලෙස ඔඩෑෂ ආයතනයේ රවින්ද්‍ර ගුරුගේ යටතේ ශිල්ප හැදෑරූ රුක්මල් සංස්කරණ ශිල්පියෙකු ලෙස දායකත්වය ලබා දුන් බොහෝ නිර්මාණ සම්මානයෙන් පුද ලැබීම විශේෂයෙන් සඳහන් කල යුත්තකි. 2002 සඳ අමාවක, හද විල සක්මන, ධවල කන්‍යා, සංක්‍රාන්ති, සමාරා යන ටෙලි නාට්‍ය හා චිත්‍රපට වල සංස්කරණය සඳහා සම්මාන දිනාගත් රුක්මල් රයිගම් ටෙලිනාට්‍ය සම්මාන උළෙලේ 2005, 2006 හා 2007 වසර සඳහා පිට පිට හොඳම සංස්කරණ ශිල්පියා වශයෙන් මායා රංග, ඕලු හා සමනලුන්ට වෙඩි තියන්න යන ටෙලිනාට්‍ය සඳහා සම්මාන හිමිකර ගත්තේය. ඔහුට 2009 වසරේදී "අතර මැද" යන කෙටි චිත්‍රපටය සඳහා චිත්‍රපට සංස්ථා සම්මානය හිමි විය.

ඔහුගේ දෙවන ටෙලිනාට්‍යය වන "සුළඟ මත මො-හොතක්" ජූලි 20 ද මෙල්බර්න් වාසී අපට දැක ගැනීමට ලැබෙනවා.

**ශ්‍රීනාත් :** 2007 වසරේ ඔබගේ පළමු වන නිර්මාණය "සුභ සිහින" විකාශය වුවාට පසු වසර ගණනාවක් නිහඬව සිටයි ඔබ මේ දෙවන නිර්මාණය කලේ. ඔබ ඔබේ මේ දෙවන නිර්මාණය සඳහා මේ තරම් කල් ගත්තේ ඇයි ?
**රුක්මල් :** එයට හේතු කිහිපයක් තිබෙනවා. එකක් තමයි මම 2007 ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වුනා. ඒ සමඟම මම "චිත්‍රපට හා ටෙලිනාට්‍ය නිෂ්පාදනය හා අධ්‍යක්ෂණය" පිළිබඳ Swinburne සරසවියේ උපාධි පාඨමාලාවක් හැදෑරීමට පටන් ගත්තා. ඒ සඳහා මට වැඩි කාලයක් යෙදවීමට සිදු වුනා.

**ශ්‍රීනාත් :** ඔබ ඉගෙනුම ලබන කාලයේ දීත් ඔබ කල නිර්මාණ සම්මානයට පාත්‍ර වුවා නේද ?
**රුක්මල් :** 2010 දී මම Swinburne සරසවිය සඳහා කල කෙටි චිත්‍රපටය "Grave yard shift" මෙල්බර්න් හා ඇඩිලේඩ් නගර වල පවත්වන ලද චිත්‍රපට උළෙල වල් වලදී හොඳම නිර්මාණය වශයෙන් තේරුණා. මේ දිනවල උපාධියේ අවසාන අදියර සඳහා නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන කෙටි චිත්‍රපටයට මා සුදනම් වනවා. එහි නම තමයි "ක්ලේශ". මෙය බුදු දහම ආශ්‍රිත කොට ගෙන කෙරෙන නිර්මාණයක්.

**ශ්‍රීනාත් :** ඔබට ටෙලි නාට්‍යයක් කිරීමට ප්‍රමාද වීමට හේතු වුයේ ඉහත දැක් වූ කාරණා පමනක්ම ද?
**රුක්මල් :** එපමණක්ම නෙවෙයි. පසුගිය වසර කීපය දෙස ආපසු හැරී බලන විට මා සිතනවා ටෙලිනාට්‍ය කලාව ප්‍රබල පසුබෑමකට ලක් වී තිබෙව බව. එක් එක් අය ඒ සඳහා විවිධ හේතු දැක් වුවත් සැබෑ හේතුව මම දකින ආකාරයට එය නොවෙයි. මා වසර ගණනාවක් නිහඬව මේ දෙස බලා සිටියා. ඒ අනුව මෙය මම මාගේ දෙවන නිර්මාණයට අත ගසන්නාත් ලංකාවේ සිටින මාගේ මිතුරන් එපා කියද්දිත් මා මෙයට අත ගසන්නාත් හරවත් යමක් ඉදිරිපත් කිරීමට මා තුල ඇති ආශාව නිසයි.

**ශ්‍රීනාත් :** කුමක් ද මේ ඔබ කියන වෙනස ?
**රුක්මල් :** 80 අගභාගයේ හා 90 දශකයේ ටෙලිනාට්‍ය නිර්මාණ හා නිර්මාණ ශිල්පීන් වන ධම්ම ජාගොඩ, පරාක්‍රම ගිරි ඇල්ල, ඩී. බී. නිහාල් සිංහ, ටයිටස් තොටවත්ත, ජයන්ත චන්ද්‍රසිරි, ලූෂන් බුලත් සිංහල, බන්දුල විතානගේ වැනි ශිල්පීන් අපට වුවද කල නිර්මාණ වන පළිඟු මැණිකේ, යශෝරාවය, බුමුතුරුණු, ලා හිරු දහසක්, වෙද හාමිනේ, දඬු බස්නාමානය වැනි නිර්මාණ අප හදවත් තුල ගැඹුරුම තැන්වල තැන්පත් වී තිබෙනවා. මෙවන් නිර්මාණ වල උසස් ගුණාත්මක භාවයත් නිර්මාණශීලි බවක් හා රංගන ශිල්පීන්ගේ උසස් දායකත්වයක් තිබුනා. ඒ නිසා තමයි ඒ නිර්මාණ අපට සමීප වුයේ. මගේ මේ උත්සාහයත් රසික හදවත් වලට සමීප විය හැකි එවන් ගුණාත්මක භාවයෙන් උසස් නිර්මාණයක් ජනතාවට දයද කිරීමයි.

**ශ්‍රීනාත් :** මෙය කොටස් කීපයක ටෙලිනාට්‍යයක් ද ?
**රුක්මල් :** මෙය කොටස් 30 කට වැඩි සංඛ්‍යාවක් දිවෙන නිර්මාණයක්. නමුත් මේ ටෙලිනාට්‍යම නිර්මාණය කරන අවධියේ දීම මෙල්බර්න් ප්‍රේක්ෂකයන් සඳහා මෙය ටෙලි චිත්‍රපටයක් සංස්කරණය කරනු ලැබුනා.

**ශ්‍රීනාත් :** මේ නිර්මාණයට දායකත්වය ලබා දුන්නේ කවුරුන් ද ?
**රුක්මල් :** මෙය නිෂ්පාදනය කරන්නේ මෙල්බර්න් නුවර සිටන අපේ මිත්‍ර වසන්ත බන්ඩාර. රංගනයෙන් බිමල් ජයකොඩි, සාරංග දිසාසේකර, මහේන්ද්‍ර පෙරේරා, කෞෂල්‍යා, චාන්දනී, ඩබ්. ජයසිරි, සුජානි මේනකා ඇතුලු රංගන ශිල්පීන් දායක වෙනවා. සංගීතය කසුන් කල්හාර ගේ, පිටපත ප්‍රියංකර රත්නායකගේ.

**ශ්‍රීනාත් :** මෙය පෙන්වන ස්ථානය හා දිනය සඳහන් කලොත්
**රුක්මල් :** ලබන ජූලි 20 ද Hampton Park Performing Arts Center හිදී සවස 5.30 ට මෙය ප්‍රදර්ශනය කෙරෙනවා.

සංස්කරණ ශිල්පියෙකු යනු අධ්‍යක්ෂවරයා ද රංගන ශිල්පියොද කැමරා ශිල්පියො ද දකින දේට වඩා නිර්මාණය තුල අපූර්වත්වයක් දකින ශිල්පියෙකු බව ප්‍රකට අධ්‍යක්ෂකයකු වන ටයිටස් තොටවත්තයන් ප්‍රකාශ කොට තිබෙනවා. ඒ ප්‍රකාශයට අනුව මෙම නිර්මාණය අධ්‍යක්ෂණය කරන රුක්මල් මේ සංස්කරණ තුලින් අපූර්වතම නිර්මාණයක් අපට ඉදිරිපත් කරනු ඇතැයි මා විශ්වාස කරනවා. ඔහුගේ සියළු කාර්යයන්ට අත හිත දෙන දයාබර බිරිඳ නිලංකා චන්ද්‍රජිත් හා පුතු මිනුක රුමෙත් ආදරයෙන් සිහිපත් කරන රුක්මල් ඔහුගේ මෙම නවතම නිර්මාණය නැරඹීම සඳහා ඔබ සැමට ආරාධනා කරනවා.

## හිරු නොදැක පිපෙන මල් නවකතාව මෙල්බර්න් පුරවරයේදී දොරට වඩියි

විදුණැන ලේඛක සංසදය මගින් මෙල්බර්න් පුර-වරයේ ප්‍රථමයෙන්ම දොරට වඩන නවකතාව විනීතා විජේරත්න ගේ 4 වන නව කතාව වන ''හිරු නොදැක පිපෙන මල්'' නව කතාවයි. ශ්‍රී ලංකාවේ ඉතාමත් ජනප්‍රිය වූ මෙම නව කතාව මෙල්බරන් නුවරදී දොරට වඩින්නේ ජූලි මස 21 වන ඉරුදින සවස 5.30 ට කීස්බරෝ හි චැන්ඩ්ලර් ප්‍රසංග ශාලාවේදීය. මේ සඳහා පාඨක ජනතාවට සහභාගි වන මෙන් විදුණැන ලේඛක සංගමය ගෞරවයෙන් ආරාධන කර සිටියි.

### "හිරු නොදැක පිපෙන මල්" සාර්ථක නවකතාවක් මෙන්ම ජාතික මෙහෙවරක්.

විනීතා විජේරත්න ලේඛිකාවගේ 'හිරු නොදැක පිපෙන මල් ' නවකතාව ශ්‍රී ලංකාවේදී ජනතාව අතට පත් වූයේ 2012 සැප්තැම්බර් මාසයේ කොළඹ බන්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලාවේ වසරක් පාසා පැවැත්වෙන ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදීය. විශාල ජනකායක් මධ්‍යයේ එළි දැක් වූ මෙම නව කතාව පිට වී මාස තුනක් ඉකුත් වන්නට මත්තෙන් සියලු පිටපත් විකිණී අවසන් වූවා. ඒ එහි ඇති සාර්ථක භාවය නිසයි. දශක තුනක පමන කාලයක් තිස්සේ පැවති කුරිරු ත්‍රස්තවාදයෙන් සටන් බිමේදී ජීවිත අහිමි වූ වීරෝදාර සෙබලුන්ගේ අසරන වූ පවුල් ඒකක කීපයක් වටා ගොඩ නැගුන සත්‍ය සිද්ධීන් ඇතුලත් මෙම නව කතාව සාර්ථක, හොඳ නවකතාවකටත් වඩා ශ්‍රී ලංකා මාතාවට කරන ලද ජාතික මෙහෙවරක් බව මගේ හැඟීමයි.

මෙහි කතා නායිකාව වන තාරා අංගම්මනගේ චරිතය විනීතා විජේරත්න ලේඛිකාව විසින් මනා ලෙස ගොඩ නගා ඇති ආකාරය අපූරුයි.

අප්‍රමාණ ප්‍රභේදයන්ගෙන් සමන්විත ''බලය'' යනු ලෝභය විසින් මෙහෙයැවනු ලබන ද්වේශය මත පදනම් වූ මිනිසා තුලම පමනක් ඇතිවන ලොව තිරස්චීනම මානසික විකෘතියකි. එකී මානසික ස්වභාවය කා තුල ඇති වුවත් ඔහු හෝ ඇය ජීවත්වන සමාජ වටපිටාව ඉන් දැඩිසේ පීඩා විඳී.




විනීතා විජේරත්න නමැති ප්‍රතිභාපූර්ණ, මානව දයාවෙන් යුතු ලේඛිකාව තම ඉපැදී හැදී වැඩුන මාතෘ භූමියේ ජීවත්වන සමස්ත ජනතාව ''බලය'' පිළබඳ මානසික විකෘතිය විසින් මෙහෙයැවුවන් නිසා අත්කරගත් හා අත් විඳිමින් සිටින කායික මානසික පීඩාවන් පිළිබඳව ගවේෂණාත්මකව කරුනු ඉදිරිපත් කරයි. ඒ මගින් පාඨකයා සමග සංවේදී සුහද සජ්ඣායනක යෙදෙන ''හිරු නොදැක පිපෙන මල්'' තුලින් ඇය පාඨකයා සංහිඳියාවේ ශාන්ති නිකේතනය වෙත කැඳවාගෙන යයි.

සිල් රෙදි හැඳ පැළඳ නොසිටියත් කතුවරිය භාග්‍යවත් ලොව්තුරා සම්මා සම්බුදු පිය උරුමයෙන් තමා ලද ශ්‍රී සද්ධර්ම භාග්‍ය තුලින් සමණක්ම එළැඹි හා එළැඹෙන සකලාකාරයේ සකලවිධ කායික මානසික පීඩාවන්ගන් අත්මිදී සැනසීම ලැබිය හැකි බව දයාබර මවක මෙන් මෙත් සිතින් අවධාරණය කරන්නීය.
සුගම හා සරල භාෂා ශෛලියකින් සමන්විත මෙම අගනා කෘතිය මෙල්බර්න් වාසී පාඨක ජනතාවටද තිළන කිරීමට හැකි වීම ඉතාමත්ම වාසනාවකි.

නාමල් අරණ, ගිණි අවියයි රෝස මලයි, යන නව කතා තුලිනුත් කැන්ගරු හදිය, කැන්ගරු ගීතය, ඉසුරුමත් අවුරුදු උදාව යන ළමා කතා තුලිනුත් පාඨක අවධානය දැඩි ලෙස ග්‍රහණය කරන ලේඛිකාවගේ ලේඛන ජීවන කුසලතාවය වඩා වර්ධනය වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

**පියල් වික්‍රමසිංහ**
සාමදාන විනිසුරු දිවයින පුරා (ශ්‍රී ලංකාව) සහ හිටපු විධායක නිළධාරී

### හිරු නොදැක පිපෙන මල්

අරගලයන් තුළින් බිහිවන වීරවරයන් අංශ දෙකකට වර්ග කොට දැක්විය හැකිය. එනම් ප්‍රමුඛ වීරයන් හා අප්‍රමුඛ වීරයන ලෙසය. මින් මුල් කාණ්ඩයට ගැනෙන පිරිස සටන් බිම තුළ කැපී පෙනෙන නායකයෝ වෙති. ඔවුන් සිදු කරන ලද අසීමිත කැපවීම් බොහෝ දෙනෙකුගේ අවධානයට යොමුවන අතර අනිත් පිරිස පිළිබඳ ලිඛිත හෝ අලිඛිත සාක්ෂි නොමැතිකම නිසාවෙන් අඩු අවධානයක් යොමු වේ. එහෙත් විමුක්ති අරගලයන්හි දී පෑන අවියක් කරගන්නා සාහිත්‍යකරුවන් අතින් මේ දුර්වලතාව තරමකින් හෝ මගහැරී යයි. ඔවුන් අතින් නිමවන මනඃකල්පිත වීරවරයන්ගේ චරිතාපදානය පොදුවේ සියලු දෙනා සිහිපත් කිරීමට සමත් වේ. ඒ වූ කලී සැබෑ ජාතික අවශ්‍යතාවයකි.

විදෙස් රටක ජීවත් වුවද විනීතා විජේරත්න විසින් නිමවන ලද මෙම නවකතාව තම මව්බිම වෙනුවෙ-න් නිහඬව කැපවීම් සිදුකර නිහඬව දෙනෙත් පියාගත් බොහෝ විරුදරුවන් ගැන නැවත සිතා බලන්නට ඉඩ සලසමින් බිහි කළ සාර්ථක නිර්මාණයකි. මෙය හොඳ සාහිත්‍ය නිර්මාණයකටත් වඩා ජාතික මෙහෙයවරක් බව මගේ හැඟීමයි.

**කාලසූරී සතිස්චන්ද්‍ර එදිරිසිංහ**